(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 1(2).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2015 ඔක්තෝබර් මස 23 වැනි සිකුරාදා**

## 2015 නොවැම්බර් මස 03 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

16/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— සමාජ සවිබලගැන්වීම් සහ සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවිනැගුම අරමුදල සතු රුපියල් මිලියන 3000ක් 2015 ජනාධිපතිවරණය පාදක කරගනිමින් 2014 නොවැම්බර් 02 දින සිට 2014 නොවැම්බර් 09 දක්වා දින 07ක් තුළදී අවභාවිතා කිරීම සම්බන්ධයෙන් ඊට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) ඒ සම්බන්ධයෙන් වගකිවයුත්තන්ට එරෙහිව නඩු පවරා තිබේද;

(iii) මෙතෙක් නඩු පවරා නොමැතිනම්, එම විමර්ශනයේ වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙමගින් දිවිනැගුම අරමුදලට අහිමි වූ රුපියල් මිලියන 3000ක මුදල සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(ii) රජය සතු විවිධ අරමුදල් මේ අයුරින් විෂයභාර අමාත්‍යවරුන් කිසිදු අමාත්‍ය මණ්ඩල තීරණයක් නොමැතිව සිය අභිමතය පරිදි විනාශ කිරීමට ඉඩ ලැබීම අයහපත් පූර්වාදර්ශයක් බැවින් අනාගතයේදී එවැනි දෑ වැළැක්වීමට විෂයභාර අමාත්‍යවරයා වශයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මෙවැනි මූල්‍ය අපරාධ පිළිබඳව විමර්ශනයන් සම්බන්ධව අධිකරණ ක්‍රියාමාර්ග කඩිනම් කරගැනීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට හෙළිකරන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

37/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තැන්පතු පොලී හා ණය පොලී අනුපාත ඉතා පහළ අගයක පැවතුනද, වාණිජ බැංකු තම ණය පත් පොලී අනුපාත ඉතා ඉහළ අගයක පවත්වා ගෙන යන බවත්;

(ii) එම තත්ත්වය තුළින් ගණුදෙනුකරුවන් සූරා කෑමකට ලක් වන බවත්;

(iii) මෙරට බැංකු සතුව අතිරික්ත ද්‍රවශීලතාවයක් තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ණය පත් පොලී අඩු කිරීමට ගන්නා පියවර කවරේද;

(ii) තැන්පතු පොලී අනුපාත ඉහළ දැමීමට ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) බැංකු හා මූල්‍යායතන ඒකාබද්ධ කිරීමට රජය කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එයට හේතු කවරේද;

(iii) එම ඒකාබද්ධ කිරීම සිදු කරනු ලබන දිනය කවරේද;

(iv) බැංකු හා මූල්‍යායතන ඒකාබද්ධ කිරීම තුළින් රජය අපේක්ෂා කරන්නේ කවරක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

86/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තේ දළු මිල සීඝ්‍රයෙන් පහත බැසීම නිසා ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය බරපතල අර්බුදයක් කරා යොමු වීම හේතුවෙන් විශේෂයෙන් කුඩා තේ වතු හිමියන් දරුණු ආර්ථික අර්බුදයකට ලක් වී ඇති බවත්;

(ii) වර්තමානයේ අමු තේ දළු කිලෝවක් සඳහා ගෙවනු ලබන මිල රු.54/= දක්වා පහත බැස ඇති බවත්;

(iii) අමු තේ දළු කිලෝවක් සඳහා ගෙවන මිල රු.50/= දක්වා අඩු වුවහොත්, ශ්‍රී ලංකාවේ තේ කර්මාන්ත ශාලා සියල්ල වැසීයාමේ අවදානමක් පවතින බවත්;

(iv) පසුගිය මැතිවරණ ප්‍රකාශනයෙන් අමු තේ දළු සඳහා රු.80/ = ක සහතික මිලක් ලබා දෙන බව සඳහන් කලද දැනට එය ක්‍රියාත්මක නොවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ අර්බුදය නිසා පසුගිය මාසය ඇතුලත වසා දමා ඇති තේ කම්හල් පිළිබඳව වාර්තාවක් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) මෙලෙස තේ කර්මාන්තය අනතුරක් වෙත ලඟා වීම සඳහා බලපෑ සහ මේ මොහොතේද බලපාන හේතු කවරේද;

(ii) තේ වතු හිමියන්, කර්මාන්තශාලා හිමියන් සහ ඒ ආශ්‍රිත රැකියා කරනු ලබන දස ලක්ෂ සංඛ්‍යාත පිරිසක් රැකගැනීම සඳහා අනුගමනය කිරීමට බලාපොරොත්තු වන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේනම්, ඒ මන්ද?

88/'15

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා නීති විද්‍යාලය තුල අධ්‍යාපන කටයුතු සහ විභාග කටයුතු සිදුවන්නේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය තුනෙන්ම බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2014 වසරේ නීති විද්‍යාල සිසුන්ගේ විභාග ප්‍රශ්න පත්‍ර ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් නිකුත් කර තිබීම හේතුවෙන් සිංහල හා දෙමළ මාධ්‍යයෙන් අධ්‍යාපනය හැදෑරූ සිසුන්ට එක්වරම ඉංග්‍රීසි මාධ්‍යයට පරිවර්තනය වීමට සිදුවීම නිසා එම සිසුන්ට ඉමහත් අසාධාරණයක් හා අපහසුතාවයක් ඇතිවූ බවත්;

(ii) මෙම කාරණය නිසා හිටපු අග්‍රවිනිශ්චයකාරතුමා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය උල්ලංඝනය කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) මින් ඉදිරියට නීති විද්‍යාලයේ සිසුන්ගේ විභාග සඳහා නිකුත් කරනු ලබන ප්‍රශ්න පත්‍ර රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුව සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවෙන් නිකුත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා උපදෙස් ලබාදෙන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

127/'15

ගරු විජිත හේරත් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හැටන් නගරයේ දුඹුරුගිරිය ප්‍රදේශයේ ලෝක බැංකු ආධාර මත ඉදි වූ නිවාස සමූහයක සිංහල, දෙමළ සහ මුස්ලිම් පවුල් 35ක් පමණ, වර්ෂ 33කට අධික කාලයක් තුළ පදිංචිවී සිටින බවත්;

(ii) මෙම පදිංචිකරුවන්ගෙන් කොටසකට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් නීත්‍යානුකූල ඉඩම් ඔප්පු ලබාදී ඇති බවත්;

(iii) වටවල වැව්ලි සමාගම විසින් මෙම නිවැසියන්, නිවාසවලින් ඉවත්කර, එම භූමි ප්‍රදේශය සමාගමට අත්පත්කර ගැනීම සඳහා අධිකරණමය ක්‍රියාමාර්ගයකට අවතීර්ණ වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) හැටන් දික්ඔය නගර සභාව මෙම නිවැසියන් පදිංචි භූමිය පවරා ගැනීම සඳහා ඒකමතිකව යෝජනාවක් සම්මත කර ඇති බවත්;

(ii) මෙම භූමි ප්‍රදේශය සමාගමට පවරා ගැනීම වළක්වා සාධාරණය ඉටුකර ගැනීම සඳහා එම නිවැසියන් විසින් ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සහ අදාළ දේශපාලනඥයන් දැනුවත් කර ඇති බවත්;

එතුමා තවදුරටත් දන්නෙහිද?

(ඇ) (i) මෙම කරුණු සැළකිල්ලට ගෙන වටවල සමාගමේ බලපෑම්වලින් මෙම නිවැසියන්ව මුදවාගෙන ඔවුන්ගේ නිවාස අයිතිය තහවුරු කරදීම සඳහා මැදිහත් වන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

153/'15

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වතු ආශ්‍රිත දෙමළ මාධ්‍ය පාසල්වලට පාසල් පාදකව ගුරු සහායකවරුන් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවන ලදුව, අගලවත්ත, වියන්ගල්ල, අංක 25/2 දරන නිවසේ පදිංචි, එෆ්. රුෂානා මෆූර් මිය විසින් ඉල්ලුම්පතක් ඉදිරිපත් කරන ලද බවත්;

(ii) ඒ අනුව ඇය සම්මුඛ පරීක්ෂණය සඳහා 2015.03.02 දින කැඳවීම් අංක 199 (B) යටතේ පෙනී සිටි බවත්;

(iii) ඇයගේ පදිංචි ප්‍රදේශයේ වතු පාසල්වල එම තනතුර සඳහා පුරප්පාඩු පැවතියද, රුෂානා මජුර් මියට මෙතෙක් ගුරු සහායක පත්වීමක් ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඇයට ගුරු සහායක පත්වීම නොපමාව ලබාදීම සඳහා අවශ්‍ය පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

38/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට 2014 දක්වා වර්ෂ 05ක කාලය තුළ ජලභීතිකා රෝගය වැළඳුනු ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) උක්ත වර්ෂ පහ තුළ ජලභීතිකා රෝගයට ප්‍රතිකාර කිරීම වෙනුවෙන් රජය වැය කළ මුදල වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එය සමස්ත සෞඛ්‍ය වියදමේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජලභීතිකා රෝගය පාලනය කිරීම සඳහා පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

90/'15

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගරු ශිරානි තිලකවර්ධන ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරතුමියගේ සභාපතිත්වයෙන් පත්කරන ලද ආයුධ ජාවාරම පිළිබඳව විමසා බලන කොමිසමේ වාර්තාවක් තිබේද;

(ii) එම වාර්තාව ප්‍රකාශයට පත් කරන්නේද;

(iii) ප්‍රකාශයට පත්කරන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේනම්, ඒ මන්ද?

39/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ රැකියා අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට 2014 දක්වා (එම වර්ෂ දෙකද ඇතුලත්ව) වසර 5 තුළ මැද පෙරදිග රටවලදී ලිංගික අපයෝජනයන්ට ලක්වූ කාන්තාවන් සංඛ්‍යාව වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාන්තාවන් සේවය කළ මැදපෙරදිග රටවල් කවරේද;

(iii) උක්ත එක් එක් කාන්තාව වෙනුවෙන් එම රටවල ශ්‍රී ලංකා තානාපති කාර්යාල විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත ලිංගික අපයෝජනයන්ට සම්බන්ධ පුද්ගලයන්ට එරෙහිව නීතිමය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම එක් එක් පුද්ගලයාට එරෙහිව ගත් පියවර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) විදෙස්ගත වන ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ ආරක්ෂාව පිළිබඳ පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

(iii) ශ්‍රී ලාංකික කාන්තාවන් ගෘහ සේවය සඳහා විදෙස්ගත වීම සීමා කිරීමට ගන්නා පියවර කවරේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

විසර්ජන පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— (52 වැනි අධිකාරිය වන) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තිය සමග කියවනු ලබන 25 වැනි වගන්තිය යටතේ සුරාබදු බලපත්‍ර සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 13 දිනැති අංක 1901/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.10.20 වැනි දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ජුනි 11 දිනැති අංක 1918/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.10.20 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

---

### 2015 නොවැම්බර් මස 04 වැනි බදාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

42/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ හඳුන්කූරු හා සුවඳ දුම් කුඩු පරිභෝජනය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම ප්‍රමාණයෙන් ශ්‍රී ලංකාවේ නිපදවන හා පිටරටින් ගෙන්වන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) හඳුන්කූරු හා සුවඳ දුම් කූඩු සෑදීමට ගන්නා අමුද්‍රව්‍ය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මෙම අමුද්‍රව්‍ය මිනිස් සිරුරට අහිතකර ද නැද්ද යන්න පිළිබඳ පරීක්ෂා කරන ආයතනයක් රට තුළ තිබේද;

(iii) එසේ නම්, එම ආයතනයේ නම කවරේද;

(iv) එම ආයතනය මගින් පරීක්ෂා කිරීමේදී මිනිස් සිරුරට හානිකර අමුද්‍රව්‍ය භාවිතා කරමින් හඳුන්කූරු හා සුවඳ දුම් කූඩු නිෂ්පාදනය කළ ආයතන හඳුනාගෙන තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) හඳුන්කූරු හා සුවඳ දුම් නිෂ්පාදනය කිරීමේදී මිනිස් සිරුරට අහිතකර රසායන ද්‍රව්‍ය භාවිතය වැලැක්වීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

91/'15

ගරු වාසුදේව නානායක්කාර මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය අතුරු අයවැයෙන් සිමෙන්ති විකුණුම් මිල තුළ ඇතුලත්ව තිබූ රු. 90.00ක බද්දක් ඉවත් කරනු ලැබුවේ සිමෙන්ති මිල අඩු කිරීමේ ක්‍රියාමාර්ගයක් වශයෙන් නොවේද;

(ii) ඒ නිසා රජයට මසකට අහිමි වූ බදු ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෙම මිල අඩුකිරීම 2015 පෙබරවාරි මස 20 වන දින ගැසට් පත්‍රයේ පළකරනු ලදුව සිල්ලර මිල රු. 840.00ක් ලෙස නියම කර තිබේද;

(ii) එදින සිට අද දක්වා එම මිලට දිවයින පුරා සිමෙන්ති අලෙවි වන්නේද;

(iii) නොඑසේ නම්, රජයේ ආදායමද අහිමි වී පාරිභෝගිකයාට ලබාදීමට අරමුණු කළ සහනයද නොලැබී යාම බරපතල වරදක් නොවන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) අතුරු අයවැයෙන් ප්‍රකාශ කරන ලද පරිදි මෙම මිල අඩුවීම ක්‍රියාත්මක කරවීම සඳහා පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර බලපවත්වනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

148/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට දරුවන් දෙදහසකට ආසන්න ප්‍රමාණයක් විද්‍යා, තාක්ෂණ, වාණිජ හා කලා යන විෂය ධාරාවන් හතර යටතේ අධ්‍යාපනය ලබන මාතර මහින්ද රාජපක්ෂ විද්‍යාලය බරපතල ගොඩනැගිලි අර්බුදයකට මුහුණ පා සිටින බවත්;

(ii) නේවාසිකාගාරය, ශ්‍රවණාගාරය සහ තෙමහල් නව ගොඩනැගිලි ඉදිකිරීම ආරම්භ කළද, පසුගිය ජනවාරි මස 15 දින සිට එම සියලු ඉදිකිරීම් අතරමග නවතා දමා ඇති බවත්;

(iii) ක්‍රීඩාපිටිය සඳහා බිම් කොටස් පවරාගනු ලැබුවද, එහි ඉදිකිරීම් ප්‍රමාද වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම විදුහලේ නේවාසිකාගාරය ඉදිකිරීම සඳහා කටයුතු කරන්නේද;

(ii) එසේනම්, එම දිනය කවරේද;

(iii) නවතා දමා ඇති අනෙකුත් ඉදිකිරීම් ආරම්භ කරන දිනය කවරේද;

(iv) දහස් ගණනක් වූ දරුවන්ට අත්‍යවශ්‍ය ක්‍රීඩා පහසුකම් සඳහා පිටිය සකස් කරන්නේද;

(v) නොඑසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මාතර මහින්ද රාජපක්ෂ විද්‍යාලය වසා දැමීමේ උත්සාහයක් ඇතැයි ප්‍රචාරය වන මතයේ සත්‍ය අසත්‍ය බව එතුමා මෙම සභාවට හෙළිකරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

43/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මස් සඳහා ඇතිකරන බ්‍රොයිලර් කුකුළන්ගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ ගැටලු පවතින බවත්;

(ii) ගොවිපොළ හිමියන් නියමිත දින ගණනට පෙර මෙම සතුන් මස් සඳහා ඝාතනය කරන බවත්;

(iii) එම සතුන් ඉක්මනින් වැඩීම සඳහා යොදා ගන්නා බෙහෙත් ද්‍රව්‍ය සහ ආහාර මිනිස් සිරුරට හානිකර බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ මස් සඳහා බ්‍රොයිලර් කුකුළන් ඇති කරන ගොවිපොළ සංඛ්‍යාව;

(ii) මෙම ගොවිපොළවල සිටින කුකුළන් ප්‍රමාණය;

(iii) 2014 වර්ෂයේ කුකුළු මස් නිෂ්පාදනය (කිලෝග්‍රෑම්);

(iv) ඒ අනුව ඒක පුද්ගල කුකුළු මස් පරිභෝජනය;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත (අ) හි සඳහන් ගැටලු විසඳීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

92/'15

ගරු වාසුදේව නානායක්කාර මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හමුදා සාමාජිකයින්ගේ දරුවන් සඳහා වෙන්වූ පාසල් වෙනම පවත්වාගෙනයාමේ ප්‍රතිපත්තිය එතුමා පිළිගන්නෙහිද?

(ආ) හමුදාවේ පරිත්‍යාගශීලී වූ, නිලධාරී හා යුධ භටයන් දෙපිරිසම වෙනුවෙන් විශේෂ වරප්‍රසාද ලබාදීම අවශ්‍ය වුවත්, ඔවුන්ගේ දරුවන්ට වෙනම පාසල් තිබීමෙන් සමාජයේ නව සමාජ ප්‍රභේදයක් මත පහසුකම් ඇති කරනු ලබන බවත් එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) මෙම පාසල්වල සිටින නිලධාරීන්ගේ දරුවන් හා සාමාන්‍ය සෙබළුන්ගේ දරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙවැනි පාසල්, අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතට ගෙන අනෙකුත් දරුවන්ද ඇතුලත් කරගෙන පවත්වාගෙන යාමට අදහස් නොකරන්නේ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

44/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලක්ෂපාන දිය ඇල්ලට ඉහළින් මස්කෙළිය ඔයේ ඉදිකර ඇති හා ඉදිකරමින් පවතින විදුලි බලාගාර වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මෙම විදුලිබලාගාර හේතුකොට ගෙන පරිසරයට සිදු වන බලපෑම් පිළිබඳව පරිසර අධ්‍යයන වාර්තා කැඳවා තිබේද;

(iii) එසේ නම්, එම වාර්තා මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ලක්ෂපාන දිය ඇල්ලට උක්ත බලාගාරයන් හේතුවෙන් හානි විය හැකි බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම හානි අවම කර ගැනීමට පියවර ගෙන තිබේද;

(iii) එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 නොවැම්බර් මස 05 වැනි බ්‍රහස්පතින්දා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

45/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාගරික සංවර්ධන අධිකාරිය යටතේ පැවති හම්බන්තොට තානායම පෞද්ගලික අංශයට පවරා ඇති බවත්;

(ii) එහි සේවය කළ සේවක මහතුන් නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත කර ඇති බවත්;

(iii) මෙම ක්‍රියාවලිය නාගරික සංවර්ධන අධිකාරියට මූල්‍යමය පාඩුවක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම තානායම නැවත නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගැනීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

130/'15

ගරු වාසුදේව නානායක්කාර මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ මහ නගර සභාවට අයත්ව තිබූ රේස්කෝස් පිට්ටනිය අවට පාසල් 10කට පමණ ක්‍රීඩා උත්සව පැවැත්වීමට පහසුකම් ලබා දුන් ස්ථානයක් බවත්;

(ii) මේ වනවිට අදාළ පාසල්වලට එම පහසුකම් අහිමි වී ගොස් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කොළඹ මහ නගර සභාවට අයත්ව තිබූ රේස්කෝස් පිට්ටනියේ වර්තමාන අයිතිකරුවන් කවුරුන්ද;

(ii) එය අත්පත් කරගත් පුද්ගලයන් හෝ ආයතන ඉහත කී භූමිය වෙනුවෙන් නගර සභාවට ගෙවා ඇති මුදල කොපමණද;

(iii) ක්‍රීඩා පිටි අහිමි එම පාසල් දරුවන් වෙනුවෙන් වර්තමානයේදී අදාළ පහසුකම් ලබා දෙන්නේ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

149/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය සේවකයින්ට යතුරුපැදි ලබා දීමේ වැඩපිළිවෙළ යටතේ මේ වසර තුළ යතුරු පැදි ලබා දුන් සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් ආයතනය අනුව යතුරුපැදි ලබා දුන් සේවකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) පසුගිය ජනාධිපතිවරණයේදී පොරොන්දු වූ පරිදි, යතුරුපැදි සඳහා අයකරගත් රුපියල් පනස්දහසක (රු.50,000/=) මුදල නැවත ලබාදී ඇති සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) යතුරුපැදි සඳහා අයකරගත් රුපියල් පනස්දහසක මුදල නැවත ලබාදී ඇති සේවකයින්ගේ නම් කවරේද;

යන්නත් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) රාජ්‍ය සේවකයින් සඳහා යතුරුපැදි නොමිලයේ ලබාදීමේ වැඩපිළිවෙළ නතර කර තිබේද;

(ii) මෙතෙක් අයකර ගත් රුපියල් පනස්දහසක මුදල සියලුම දෙනාට නැවත ලබාදීම සිදු කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

46/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1994.02.26 දින සංස්කෘතික නිලධාරී තනතුරට බඳවා ගැනීමේ තරඟ විභාගය පැවැත්වූ බවත්;

(ii) 1998.06.23 දින උක්ත විභාගය සමත් වූ පිරිස සංස්කෘතික නිලධාරීන් ලෙස බඳවා ගත් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) සංස්කෘතික නිලධාරීන් සංස්කෘතික සහකාර අධ්‍යක්ෂ තනතුරට උසස්වීම් ලැබීමට සම්පූර්ණ කළ යුතු සුදුසුකම් කවරේද;

(ii) මේ වනවිට එම සුදුසුකම් සපිරූ සහ උසස්වීම් හිමි නොවූ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිලධාරීන්ට උසස්වීම් ලබා දීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

131/'15

ගරු වාසුදේව නානායක්කාර මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය විසින් රාජ්‍ය බැංකුවලින් සමූපකාර සමිතිවලට ලබාදී තිබූ ණය කපා හැරීමට තීරණයක් ගෙන තිබේද;

(ii) එසේනම්, එම තීරණය ක්‍රියාත්මක වූ දිස්ත්‍රික්ක කවරේද;

(iii) එම තීරණය රත්නපුර දිස්ත්‍රික්කයේ මෙතෙක් ක්‍රියාත්මක නොවීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

47/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— තිරසර සංවර්ධන හා වනජීවි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විල්පත්තු අභය භූමියේ අධි සංවේදී කලාපයේ පදිංචි වී සිටින ජනතාව ඉන් ඉවත් කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම ජනතාවට වෙනත් ප්‍රදේශයන්හි ඉඩම් ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත අභය භූමියේ පදිංචි පුද්ගලයන්ට එරෙහිව පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

(iii) වැරදිකරුවන්ගේ නම්, ලිපින හා තනතුරු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2015 නොවැම්බර් මස 06 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

48/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වෙළඳුන්ගේ කූට උපක්‍රම හේතුවෙන් කුරුඳු කර්මාන්තය බිඳ වැටීමේ අවදානමක් ඇති බවත්;

(ii) ප්‍රමිතියෙන් බාල කුරුඳු නිෂ්පාදන අපනයනය කළ පසු නැවත ආපසු හරවා එවා ඇති බවත්;

(iii) මෙම තත්ත්වය ශ්‍රී ලංකාවේ කීර්ති නාමයට විශාල හානියක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2014 වර්ෂයේදී අපනයනයෙන් පසු ප්‍රමිතියෙන් බාල වීම හේතුවෙන් ආපසු හරවා එවන ලද කුරුඳු නිෂ්පාදන කවරේද;

(ii) ඒවායේ ප්‍රමාණය හා වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම නිෂ්පාදන අපනයනය කළේ කවුරුන්ද;

(iv) එම පුද්ගලයාගේ සමාගම සම්බන්ධව නීතිමය පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අපනයනය කරන කුරුඳු නිෂ්පාදනයන්හි ප්‍රමිතිය පරීක්ෂා කිරීමට මේ වනවිට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(ii) ප්‍රමිතියෙන් තොර කුරුඳු අපනයනය වැලැක්වීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

132/'15

ගරු වාසුදේව නානායක්කාර මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමුපකාර සමිති ව්‍යාපාරය පිළිබඳව පත්කරන ලද කොමිෂන් සභාවේ වාර්තාව එවකට ජනපතිනිය වූ චන්ද්‍රිකා කුමාරණතුංග මැතිනියට භාර දී තිබේද;

(ii) එම වාර්තාව මේ වනතුරු එළිදක්වා නොමැති නම්, එයට හේතු කවරේද;

(iii) එය මහජනයා අතට පත්කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

150/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කඳුරට අධිවේගී මාර්ගයේ පළමු කොටසට පසුගිය මහ මැතිවරණයට පෙර මුල්ගල් තැබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කඳුරට අධිවේගී මාර්ගයේ පළමු කොටසට මුල්ගල තැබූ දිනය කවරේද;

(ii) එම ආරම්භක කොටසේ ආරම්භක හා අවසාන ස්ථාන කවරේද;

(iii) එහි මුළු දුර ප්‍රමාණය කොපමණද;

(iv) පළමු කොටස සඳහා ගමන් මාර්ගයට අදාළ ඉඩම් හඳුනාගෙන තිබේ නම්, ඒ ගම්මාන හා නගර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉදිකිරීම් සඳහා අවශ්‍ය පාරිසරික වාර්තාව ලබාගෙන ඇති දිනය කවරේද;

(ii) ශක්‍යතා අධ්‍යයනය සිදුකර ඇති දිනය කවරේද;

(iii) මෙම ඉදිකිරීම සඳහා තෝරාගෙන ඇති ආයතනයේ නම කවරේද;

(iv) අදාළ තෝරාගැනීම සිදුකරන ලද ක්‍රමවේදය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම කොටස සඳහා අවශ්‍ය ණය ගිවිසුමට අත්සන් තබා තිබේද;

(ii) ණය ලබාගන්නා ආයතනය කවරේද;

(iii) ණය මුදල සඳහා වන පොළිය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) (i) කඳුරට අධිවේගී මාර්ගයේ පළමු කොටස සඳහා වැය වන මුළු මුදල කොපමණද;

(ii) ඒ අනුව කිලෝමීටරයකට වැයවන මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

49/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මිල්කෝ සමාගමේ කිරි පිටි නිෂ්පාදනය පහත වැටී ඇති බවත්;

(ii) ඒ අනුව වෙළඳපොළ තුළ හයිලන්ඩ් කිරි පිටි නොමැති බවත්;

(iii) මෙය පාරිභෝගිකයන්ට හා සමාගමට විශාල පාඩුවක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2010.01.10 දින සිට 2014.12.31 දින දක්වා කාලය තුළ මිල්කෝ සමාගමේ කිරි පිටි නිෂ්පාදනය කිලෝග්‍රෑම් වලින් වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2015 වර්ෂයේ පළමු කාර්තුව තුළ නිෂ්පාදිත කිරි පිටි ප්‍රමාණය කිලෝග්‍රෑම් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මිල්කෝ සමාගමේ කිරි පිටි නිෂ්පාදනය ඉහළ දැමීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

133/'15

ගරු වාසුදේව නානායක්කාර මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ විශ්වවිද්‍යාල නොවන ආයතන මඟින් පවත්වාගෙන යනු ලබන ඉංජිනේරු, ගණකාධිකාරී හා වෙනත් වෘත්තීයවේදී පාඨමාලා සංඛ්‍යාව ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ආයතන එක් එක් පාඨමාලාව සඳහා අයකරනු ලබන පාඨමාලා ගාස්තුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ඇති විශ්වවිද්‍යාලවල ගාස්තු අයකර පවත්වාගෙන යනු ලබන පාඨමාලා කවරේද;

(ii) එම එක් එක් පාඨමාලාව සඳහා අයකරනු ලබන පාඨමාලා ගාස්තුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) වර්ෂ 2012 සිට 2015 දක්වා එම ගාස්තුවල ඇතිවූ වෙනස්වීම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

151/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 සැප්තැම්බර් 30 දින වනවිට රැකියා විරහිත උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම උපාධිධාරීන් සංඛ්‍යාව ඔවුන් ලබා ඇති උපාධිය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උපාධිධාරීන් වෙත රැකියා ලබාදීම සඳහා වූ වත්මන් ආණ්ඩුවට ඇති වැඩපිළිවෙළ කවරේද;

(ii) ඒ අනුව 2015 වර්ෂය සඳහා බඳවා ගැනීමට අපේක්ෂිත උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දැනට වාර්තා වී ඇති ආකාරයට රාජ්‍ය සේවයේ උපාධිධාරීන් සඳහා වූ පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) 2015 සිට 2019 දක්වා වර්ෂ පහ තුලදී විශ්වවිද්‍යාල තුළින් සහ බාහිර පාඨමාලා තුළින් උපාධිධාරීන් වීමට අපේක්ෂිත දූ දරුවන්ගේ සංඛ්‍යාව වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එකී වර්ෂ සඳහා රාජ්‍ය සේවයේ ඔවුන් වෙනුවෙන් නිර්මාණය වීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාව වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේනම්, ඒ මන්ද?

52/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ විශාඛා විද්‍යාලයේ උසස් පෙළ පන්ති සඳහා ශිෂ්‍යාවන් ඇතුළත් කර ගැනීමේ දී සලකා බැලෙන නිර්ණායක කවරේද;

(ii) 2015 වර්ෂයේ දී කොළඹ විශාඛා විද්‍යාලයේ උසස් පෙළ පන්ති සඳහා ඇතුළත් කර ගත් ශිෂ්‍යාවන්ට හැදෑරීමට ඇති විෂය ධාරාවන් කවරේද;

(iii) එම එක් එක් විෂය ධාරාවන් සඳහා නවක උසස් පෙළ ශිෂ්‍යාවන්ට ඇති පන්ති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද ;

(iv) එම එක් එක් පන්තියේ සිටින ශිෂ්‍යාවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) 2015 වර්ෂයේ දී උසස් පෙළ හැදෑරීම සඳහා කොළඹ විශාඛා විද්‍යාලයට වෙනත් විද්‍යාලයන්ගෙන් ඇතුළත් වූ ශිෂ්‍යාවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (v) හි සඳහන් එක් එක් ශිෂ්‍යාවගේ නම, දිස්ත්‍රික්කය, අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයට මුහුණ දුන් පාසල හා උසස් පෙළ විභාගය සඳහා හදාරන විෂය ධාරාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) විශාඛා විද්‍යාලයට ඇතුළත්වීම සඳහා එම එක් එක් ශිෂ්‍යාවට තිබූ සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

*

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකාව තුළ ශීඝ්‍රයෙන් වර්ධනය වන අපරාධ මැඩ පැවැත්වීම සහ නීතිය ක්‍රියාත්මක කිරීමේදී සිදුවන ප්‍රමාදයන් වළක්වා ගැනීම පිළිබඳව කරුණු විමර්ශනය කර වාර්තා කිරීම පිණිස වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

ශ්‍රී ලංකාව තුළ වැඩිවෙමින් පවතින අපරාධ මැඩ පැවැත්වීම සහ නීතිය ක්‍රියාත්මක කිරීමේදී සිදුවන ප්‍රමාදයන් වළක්වා ගැනීම මෙරට ජනතාවගේ ප්‍රමුඛ අවශ්‍යතාවයක් බවට පත්වී ඇති හෙයින්ද,

ඒ පිළිබඳව දැඩි අවධානයක් යොමුකර ප්‍රතිකර්ම යෙදීමේ වගකීම මෙම පාර්ලිමේන්තුව වෙත පැවරී ඇති හෙයින්ද,

පහත සඳහන් කාරණා පිළිබඳව කරුණු විමර්ශනයකර සුදුසු නිර්දේශයන් ඉදිරිපත් කිරීම පිණිස පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

(අ) පසුගිය වකවානුවේ සිදුවූ අපරාධවල ස්වභාවය, එසේ අපරාධ සිදුවීම සඳහා බලපා ඇති කරුණු කාරණා, අපරාධ සිදුවීම අවම කරගැනීම සඳහා අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග සහ අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සහ/හෝ සංශෝධනයන්;

(ආ) සිවිල් සහ අපරාධ නඩුවලදී සිදුවන ප්‍රමාදයන් වළක්වා ගැනීම පිණිස අනුගමනය කළ යුතු නිසි ක්‍රියා පිළිවෙත් සහ අලුතෙන් පැනවීමට අවශ්‍ය සහ/හෝ සංශෝධනයන්ට ලක්විය යුතු නීති රීති; සහ

(ඇ) ඉහත කරුණුවලට ආනුෂංගික වන්නා වූ සහ අවස්ථානුකූලව, සුදුසුයැයි හා අවශ්‍යයැයි කාරක සභාවට හැඟෙන සහ කාරක සභාව විසින් සලකා බලනු ලබන කරුණට බලපාන වෙනත් කාරණා.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපතිවරයා කථානායකතුමා විසින් නම් කළ යුතු ය;

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 95හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, කාරක සභාව සාමාජිකයන් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

3. එම කාරක සභාවට,

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) පුද්ගලයන්, ලිපි ලේඛන හා වාර්තා ගෙන්වා ගැනීමට, පාර්ලිමේන්තුව හෝ එබඳු කාරක සභාවක් ඉදිරියේ පෙනී සිටින ලෙස ඕනෑම පුද්ගලයෙකුට නියම කිරීමට ද, එබඳු පුද්ගලයන්ගේ සන්තකයේ හෝ පාලනය යටතේ පවතින යම් ලිපියක්, පොතක්, වාර්තාවක් හෝ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඇ) සාක්ෂ්‍යකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කර ගැනීමට ද, කාරක සභාවේ සභාපති හෝ ඒ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් දිවුරවනු ලැබූ සාක්ෂ්‍යකරුවන් විභාග කිරීමට ද;

(ඈ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයින්ගේ සහ ප්‍රවීණයන්ගේ සහය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල්තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යාමට ද;

බලය තිබිය යුතුය.

4. සිය පළමුවැනි රැස්වීම් දිනයේ සිට මාස (06) හයක කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් ලබාදෙන අන් කවර කාල සීමාවක් තුළ හෝ කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***